# 10 ශ්‍රේණිය සිංහල සාහිත්‍ය රසාස්වාදය

# වෙසක් පහන

## 04 ඒකකය



සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

{ආදර්ශ ප්‍රශ්න, පසුගිය විභාග ප්‍රශ්න, පළාත් ප්‍රශ්න විචාර සහ පිළිතුරු අන්තර්ගත කර ඒකකය සම්පූර්ණයෙන් ම ආවරණය කර ඇත.}

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 04. වෙසක් පහන

- **විචාර ලිවීමේදී හැඳින්වීම**

✓ ජී.බී සේනානායකයන්ගේ දුප්පතුන් නැති ලෝකය නම් කෙටි කතා සංග්‍රහයෙන් උපුටා ගත් වෙසක් කූඩුවක් තැනීම පිළිබඳ කතා ප්‍රවෘතියක් පාදක කර ගත් කෙටි කතාවකි **"වෙසක් පහන"**. තම වැඩිහිටි සොහොයුරා විසින් තනන ලද වෙසක් පහනට බාල සොහොයුරාගේ අත්වැරැද්දකින් හදිසියේ ගිනි ඇවිළීම වැනි සරල සිද්ධියක් වඩාත් සංකීර්ණ සිද්ධියක් ලෙස පාඨකයා අමුවේ තබන්නට මෙම නිර්මාණය ඔස්සේ කතුවරයා උත්සාහ දරා ඇත.

- **අදර්ශ විචාර ප්‍රශ්න**

1. වෙසක් පහන සාර්ථක කෙටිකතාවකි. කෙටි කතා ලක්ෂණ ඇසුරෙන් විමසන්න.
   (ලකුණු 15)
2. වෙසක් පහන කෙටිකතාවෙහි චරිත නිරූපණය පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.
   (ලකුණු 15)
3. 'ළමා සිතිවිලි හා ළමා මනස ක්‍රියාකරන අන්දම වෙසක් පහන කෙටිකතාවේ මනාව නිරූපණය කෙරේ' විමසන්න. (ලකුණු 15)
4. වෙසක් පහන කෙටිකතාවේ අවස්ථා හා සිද්ධි නිරූපණය පිළිබඳ ඇගයීමක් කරන්න.
   (ලකුණු 15)
5. රසවත් කෙටිකතාවක් නිර්මාණය කිරීමට එක් සුළු සිදුවීමක් ප්‍රමාණවත් වේ. වෙසක් පහන කෙටිකතාව ඇසුරෙන් මේ කියමන පැහැදිලි කරන්න.
   (ලකුණු 15)

- **ආදර්ශ උදෘත**

✓ **"මිදුලේ දෙල් ගසෙහි බඳින ලද ගොනා තම කරෙහි බැඳි ගෙජ්ජි සොලවා හිස සලනු මට ඇසිණ. 'ටිකක් හිටුයි' කිරා ගොනාට ඇමතුවේ ය. ඒ හාම බෙලෙක් පනිට්ටුවක් කිසිවක හැපී පෙරළුණේ ය. මහා මාර්ගයෙහි බල්ලෙක් බුරාගෙන දිවුවේ ය."**

✓ **"දැවී යාමෙන් පසු ඉතිරි වූ කූඩුවේ කළු වූ උණ කැබෙලි කිසි විශාල සතකුගේ ඇට සැකිල්ලක් මෙන් මහා මාර්ගයෙහි පසක තිබෙන සැටි මගේ සිතට නැගිණ. දල්වන්නට පෙර වෙසක් පහන පිළිස්සී ගියේ යයි මා තුළ ශෝකයක් ඇති විය."**

✓ **"අයියා උණ පතුරු එක් කොට විශාල සම සතරැස් රාමු සයක් සාදා ඒවා එක් කොට බැඳීමෙන් අට පට්ටම් කූඩුවක් සෑදුවේ ය. එය විශාල කූඩුවකි. එය සාදන ලද්දේ කුඩා කූඩු විස්සක් ඇති විශාල පහනක මැද කූඩුව වශයෙනි."**

✓ **"මල්ලී"යි හිස පිරිමදිමින් ඔහු මා ඇමතුවේ ය. "මල්ලී කූඩුව පිලිස්සුනාට අඬන්නට එපා. අපි එන අවුරුද්දේ ඔයිටත් ලොකු කූඩුවක් හදමු."**

- **පසුගිය විභාග ප්‍රශ්න සහ ආදර්ශ ප්‍රශ්න - කෙටි ප්‍රශ්න**

1. "ඩිංගිරිගෙන් ගෙන් බත් ඉල්ලාගෙන කාල නිදාගන්න"

   I. මේ ප්‍රකාශය කෙළේ කවරෙක් ද ?
   II. මෙය ශ්‍රවණය කළ තැනැත්තා අනතුරුව කළේ කුමක් ද ?

   (2021 Pho. o/L)

2. කටේ හැටි කිරිඅප්පු ගේ උඹ කට වගේ

   I. මෙම ප්‍රකාශය කරනු ලබන්නේ කවුරුන් විසින් ද ?
   II. මෙම ප්‍රකාශය අසා කොප වන්නේ කවරෙක් ද ?

   (2018 o/L)

3. "මල්ලි" යි හිස පිරිමදිමින් ඔහු මා ඇමතුවේ ය.

III. මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද ?
IV. මෙම ප්‍රකාශය ඇතුළත් කතාවේ නම කුමක් ද ?

(2017 o/L)

- **<u>පසුගිය විභාග ප්‍රශ්න සහ ආදර්ශ ප්‍රශ්න - රචනා ප්‍රශ්න</u>**

1. වෙසක් පහන කතුවරයා ළමා මනස නිරූපණය කිරීමේ ලා දැක්වූ කුසලතාව නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(2018 o/L)

2. වෙසක් පහන කෙටිකතාවේ චරිත නිරූපණය එහි සාර්ථකත්වය කෙරෙහි බලපා ඇති ආකාරය නිදසුන් තුනක්වත් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(2016 o/L)

- **<u>පසුගිය විභාග ප්‍රශ්න සහ ආදර්ශ ප්‍රශ්න - කෙටි ප්‍රශ්න - පිළිතුරු</u>**

4. i) වෙසක් පහන් කෙටිකතාවේ අම්මා
ii) එය නොඇසුණාක් මෙන් සෙමින් සෙමින් ගොස් අම්මාගේ දෙපය ළඟ බිම හිඳ ගැනීම.

(ලකුණු 04)
(2021 Pho. o/L)

5. i) වෙසක් පහන් කෙටිකතාවේ කථකයා/ බාල සහෝදරයා විසින්.
ii) වෙසක් පහන කෙටිකතාවේ කථකයාගේ නැගණිය/ නංගී/ බාල සහෝදරිය විසිනි.

(ලකුණු 04)
(2018 o/L)

6. i) කෙටිකතාවේ කථකයාගේ වැඩිමහල් සහෝදරයා විසින්.
ii) වෙසක් පහන කෙටිකතාව.

(ලකුණු 04)
(2017 o/L)

- **<u>පසුගිය විභාග ප්‍රශ්න සහ ආදර්ශ ප්‍රශ්න - රචනා ප්‍රශ්න - පිළිතුරු</u>**

1. වෙසක් පහන කතුවරයා ළමා මනස නිරූපණය කිරීමේ ලා දැක්වූ කුසලතාව නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (2018 o/L)

★ ළමා මනස නිරූපණය කිරීමෙහිලා වෙසක් පහන කතුවරයා දැක්වූ කුසලතාව

*ලකුණු 15යි*
*නිදසුන් - ලකුණු 03යි*
*විස්තරය - ලකුණු 12යි*

- දරුවන් තම කැමැත්ත ඉටුකර ගැනීමට උනන්දු වීම

  වෙසක් පහන සෑදීමට මවගේ අනුබල නොලැබුණු නමුත් කථකයාත් නැගණියත් අයියා ඊට මෙහෙය වූ බව.

- කුඩා ළමුන් නිතර දබර කර ගැනීම හා යහළු වීම.
  නැගණිය හිඳ සිටි තැනින් නැගිට කථකයා පසුපසට පැමිණ ඔහුගේ හිසට දැඩි පහරක් දී දිව යාම.
  නැවත නැගණිය කථකයා වෙත පැමිණ වෙසක් කූඩුව බලන්න යාමට කතා කිරීම.

- තමා ප්‍රිය කරන දේ තමාට ම හිමිකර ගැනීමට උත්සාහ දැරීම
  කථකයාත් නැගණියත් දෙදෙනා ම අයියා සැස තබන උණ පතුරු තමා ළඟින් තබා ගැනීමට උත්සාහ දැරීම.
  කථකයාට හොරෙන් නැගණිය උණ පතුරු තම දෙකකුල් යට සඟවා ගැනීම

- නංගි අලුත් ගවුමක් ඇඳ, මුහුණේ පියරු දමා පැමිණි අවස්ථාවේ දී කථකයා තුළ ඊර්ෂ්‍යාවක් හටගැනීම නිසා ඔහු ක්‍රියා කරන ආකාරය
- අයියාගේ අත පිළිස්සුණු අවස්ථාවේ දී අයියා මිය යන්නට ඇතැයි උපකල්පනය කිරීම

වැනි අවස්ථා මගින් ළමා සිතුවිලි නිරූපණය කර ඇති ආකාරය දක්වා තිබිය යුතු ය.

**01. වෙසක් පහන සාර්ථක කෙටිකතාවකි. කෙටි කතා ලක්ෂණ ඇසුරෙන් විමසන්න. ලකුණු 15)**

ජී.බී සේනානායකයන්ගේ දුප්පතුන් නැති ලෝකය නම් කෙටි කතා සංග්‍රහයෙන් උපුටා ගත් වෙසක් කූඩුවක් තැනීම පිළිබඳ කතා ප්‍රවෘතියක් පාදක කර ගත් කෙටි කතාවකි **'වෙසක් පහන'**. තම වැඩිහිටි සොහොයුරා විසින් තනන ලද වෙසක් පහනට බාල සොහොයුරාගේ අත්වැරැද්දකින් හදිසියේ ගිනි ඇවිලීම වැනි සරල සිද්ධියක් වඩාත් සංකීර්ණ සිද්ධියක් ලෙස පාඨකයා අමුවේ තබන්නට මෙම නිර්මාණය ඔස්සේ කතුවරයා උත්සාහ දරා ඇත.

උත්තම පුරුෂ දෘෂ්ටි කෝණයකින් ලියා ඇති මෙහි එන සිදුවීම් ඉදිරිපත් කරන්නේ කුඩා දරුවෙකු එම සිදුවීම් ඉදිරිපත් කරන ආකාරයෙනි. එමගින් කතා රසය උද්දීපනය කර ඇත. මෙම කෙටිකතාවේ රසවත් භාවයට ඉවහල් වූ කරුණු ගණනාවකි. ඒ අතරින් වඩාත් ඉස්මතු වී පෙනෙන්නේ ළමා ක්‍රියාකාරකම් සහ සිතුවිලි වලින් කෙටි කතාව පිරී පැවතීමයි. අයියා වෙසක් පහන සෑදීමට පතුරු සකස් කිරීමේදී එක් එක් උණ පතුර මල්ලීත් නංගීත් තරඟයට පැහැර ගැනීම එවැනි එක් සිද්ධියකි.

ප්‍රබල අවස්ථා නිරූපණයන් රැසක්ද කෙටිකතාවෙන් අපට දැක ගත හැකි ය. ඒ අතරින් වඩාත් සංවේදී අවස්ථා නිරූපණයක් වන්නේ පිලිස්සුණු තුවාලයට බෙහෙත් දමාගෙන නිවසට පැමිණි අයියා මල්ලීගේ හිස අත ගාමින් වෙසක් පහන විනාශ වීම පිළිබඳ මල්ලීගේ සිත සනසන ආකාරයයි. එය වඩාත් සංවේදී නෙතට කඳුලක් උණන අවස්ථාවකි. දින ගණනාවක් පුරා මහන්සි වී සෑදූ කූඩුව ගිනි තැබීමේ වරදට මල්ලීට දඬුවම් කිරීම වෙනුවට ඔහුගේ සිත සැනසීමට කටයුතු කිරීම ආදර්ශවත් වැඩිහිටි සොහොයුරෙකුගේ ක්‍රියාවකි. එය ප්‍රබල අවස්ථා නිරූපණයකි.

ජී.බී සේනානායකයන් අවස්ථානුකූලව කතා රසය උද්දීපනය කිරීම සඳහා යොදා ගන්නා පසුබිම් වර්ණනා සහ සංකේත මෙහිලා සුවිශේෂීය ය. වෙසක් පහන ගිනි ගැනීමෙන් ළමුන්ගේ සුන් වූ බලාපොරොත්තු කතුවරයා සංකේතවත් කරන්නේ මෙසේය.

> **මිදුලේ දෙල් ගසෙහි බඳින ලද ගොනා තම කරෙහි බැඳි ගෙජ්ජි සොලවා හිස සලනු මට ඇසිණ. 'ටිකක් හිටුයි' කිරා ගොනාට ඇමතුවේ ය. ඒ හාම බෙලෙක් පතිට්ටුවක් කිසිවක හැපී පෙරළුනේ ය. මහා මාර්ගයෙහි බල්ලෙක් බුරාගෙන දිවුවේ ය.**

මෙලෙස කතා ප්‍රවෘතිය, කතා වස්තුව චරිතයන් සහ උචිත පසුබිම් වර්ණනා, යථාර්ත නිරූපණය, සංකේත, දෘෂ්ටි කෝණය, ජීවන දෘෂ්ටිය, ආදිය ද අරල සුගම රසවත් ඔහුට ආවේණික බස් වහර ආදිය ද නිසා මෙම කෙටි කතාව රසවත් නිර්මාණයක් වී ඇත. කෙටි කතාවට යොදා ඇති මාතෘකාව ද සියල්ල අනිත්‍ය බව මෙනෙහි කරන්නට සපයන ආදර්ශය ද නිසා මෙය රසවත් මෙන්ම හරවත් නිර්මාණයක් ලෙස අගය කරන්නට හේතු කර ගත හැකි ය.

Hasitha hettiarachchi
071-9020298

## 02. ළමා සිතිවිලි හා ළමා මනස ක්‍රියාකරන අන්දම වෙසක් පහන කෙටිකතාවේ මනාව නිරූපණය කෙරේ විමසන්න. (ලකුණු 15)

ජී.බී සේනානායකයන්ගේ දුප්පතුන් නැති ලෝකය නම් කෙටි කතා සංග්‍රහයෙන් උපුටා ගත් වෙසක් කූඩුවක් තැනීම පිළිබඳ කතා ප්‍රවෘතියක් පාදක කර ගත් කෙටි කතාවකි **'වෙසක් පහන'**. තම වැඩිහිටි සොහොයුරා විසින් තනන ලද වෙසක් පහනට බාල සොහොයුරාගේ අත්වැරැද්දකින් හදිසියේ ගිනි ඇවිළීම වැනි සරල සිද්ධියක් වඩාත් සංකීර්ණ සිද්ධියක් ලෙස පාඨකයා අමුවේ තබන්නට මෙම නිර්මාණය ඔස්සේ කතුවරයා උත්සාහ දරා ඇත.

උත්තම පුරුෂ දෘෂ්ටි කෝණයකින් ලියා ඇති මෙහි එන සිදුවීම් ඉදිරිපත් කරන්නේ කුඩා දරුවෙකු එම සිදුවීම් ඉදිරිපත් කරන ආකාරයෙනි. එමගින් කතා රසය උද්දීපනය කර ඇත. මෙම කෙටිකතාවේ රසවත් භාවයට ඉවහල් වූ කරුණු ගණනාවකි. ඒ අතරින් වඩාත් ඉස්මතු වී පෙනෙන්නේ ළමා ක්‍රියාකාරකම් සහ සිතුවිලි වලින් කෙටි කතාව පිරී පැවතීමයි. අයියා වෙසක් පහන සෑදීමට පතුරු සකස් කිරීමේදී එක් එක් උණ පතුර මල්ලීත් නංගීත් තරඟයට පැහැර ගැනීම එවැනි එක් සිද්ධියකි.

> **"ඔහු පහන සාදන සැටි බලා සිටින නංගීත් මාත් අතර නොයෙක් විට කලහ ඇති විය. අයියා සැස මට්ටම් කොට පසකින් තබන උණ පතුරු ඔහු ළඟින් හිඳ සිටි මම මා අසලින් තබා ගතිමි. ඔහු කපන උණ පතුරු මා ළඟින් තබා ගැනීම නංගීට රුචි නො වී ය. අයියා සැස පසක තැබූ උණ පතුරක් මා දකින්නට පෙර නංගී තම දෙකකුල යටට කොට සඟවා ගත්තාය. මා අසල බිම හිඳ සිටි ඈ මා පතුරු දකිතියි සැකයෙන් තමා හැඳ සිටි ගවුමෙන් දෙකකුල් වසා ගැනීමට එය බිම විදහන්නට විය."**

අයියාත් නංගීත් කෙටි කතාව පුරාවට ම හැසිරෙන ආකාරය පාඨකයා තුළ අපූර්ව චිත්ත රූප මවයි. එසේ ම පාඨකයා තම ළමාවියට රැගෙන යාමට මෙම අවස්ථා සිද්ධි ඉවහල් වේ. කුඩා ළමුන් නිතර කලහ කර ගනී. දෙමවුපියන් ඊට සැරවැර වෙයි. එවන් අවස්ථාවක් පහත උධෘතයෙන් අප තුළ මැවේ.

> **"ඈ තමා හිඳ සිටි තැනින් නැගිට මා පිටිපසට අවුත් මගේ හිසට දැඩි සේ පහරක් ගසා ගෙට දිව ගියා ය. අම්මා මට බැණ ඇය සනසනු මට ඇසිණ."**

එක් අවස්ථාවක පිලිස්සුණු තුවාලයට බෙහෙත් දමාගෙන නිවසට පැමිණි අයියා මල්ලීගේ හිස අත ගාමින් වෙසක් පහන විනාශ වීම පිළිබඳ මල්ලීගේ සිත සනසන ආකාරය වඩාත් සංවේදී නෙතට කඳුලක් උණන අවස්ථාවකි. දින ගණනාවක් පුරා මහන්සි වී සෑදූ කූඩුව ගිනි තැබීමේ වරදට මල්ලීට දඬුවම් කිරීම වෙනුවට ඔහුගේ සිත සැනසීමට කටයුතු කිරීම ආදර්ශවත් වැඩිහිටි සොහොයුරෙකුගේ ක්‍රියාවකි. එය ළමා මනස ක්‍රියාකරන අන්දම ඉදිරිපත් කරන ප්‍රබල අවස්ථා නිරූපණයකි.

> **"මල්ලී"යි හිස පිරිමදිමින් ඔහු මා ඇමතුවේ ය. "මල්ලී කූඩුව පිලිස්සුනාට අඬන්නට එපා. අපි එන අවුරුද්දේ ඔයිටත් ලොකු කූඩුවක් හදමු."**

මෙලෙස කෙටි කතාව පුරාවටම අපට දැකගත හැක්කේ ළමා සිත් තුළ ඇතිවන සිතුවිලි සහ ළමයින්ගේ ළමාකම නිසාම සිදු කරන දඟකාරකම් සහ ක්‍රියාකාරකම් ය. ඒවා ඉතා තාත්විකව ඉදිරිපත් කොට ඇති නිසා කෙටි කතාව වඩාත් සාර්ථක වී ඇති බව පෙනේ. අපූරු කෙටි කතාවක් වන **'වෙසක් පහන'**. රසවත් මෙන්ම හරවත් නිර්මාණයක් ලෙස අගය කළ හැකි ය.

Hasitha hettiarachchi
071-9020298